WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය


**අංක 11,729 — 1959 අප්‍රේල් 24 වැනි සිකුරාද—24.4.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | 1087 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 1088 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 1088 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 1089 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1090 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1092 |
| " සුරාබද්ද ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1959 අංක 159**

අ. ආ. කා. අංකය : C. 218/56 (III).

පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති නැන්පත් ගරු ජේ. කුරුප්පු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා නැවත වැඩ භාර ගන්නා තුරු, 1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 49 (3) වැනි වගන්තිය යටතේ, පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්, ඇම්. බී. ඩබ්ලිව්. මැදිවක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, 1959 අප්‍රේල් 20 වැනි දින සිට පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වශයෙන් වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත් කළ බව මෙයින් දන්වනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 අප්‍රේල් මස 20 වැනි දින,
අග්‍රාණ්ඩුකාරතුමාගේ කායඞාලය,
නුවරඑළිය.

---

**1959 අංක 160**

අංකය : ඩී. 32/රෙක්ව්.

**අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද රාජකීය ලංකා නාවුක හමුදාවේ උසස් කිරීම්**

1950 මාර්තු මස 1 වැනි දින සිට, තාවකාලික ලෙප්ටිනන්ට් කොමාන්ඩර් කෙනෙකු වශයෙන්—

ලෙප්ටිනන්ට් නැන්පත් පී. ඩී. නැතැනියල්ස්, රාජකීය ලංකා නාවුක හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ 1.

**1959 අංක 161**

අංකය : ඩී. 10/රෙක්ව්.

**රාජකීය ලංකා නාවුක හමුදාවේ නිලධාරියෙක් උසස් කිරීම**

පහත සඳහන් කරන ලද නිලධාරි තැන 1958 ජනවාරි මස 10 වැනි දින සිට, කොමිෂන් බලපත්‍ර ලත් නිලධාරි (ශාඛා තනතුර) තනතුරෙහි ස්ථිර කොට ඇත :—

වැඩබලන කොමිෂන් බලපත්‍ර ලත් බෑන්ඩ්මාස්ටර් නැන්පත් ඒ. පී. ධර්මරත්නම්, රාජකීය ලංකා නාවුක හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 9 වැනි දින,
කොළඹ 1.

---

**1959 අංක 162**

අඩකය : ඩී. 3/රෙක්ව්/17.

**රාජකීය ලංකා ගුවන් හමුදාව—කොමිෂන් බලපත්‍ර ලත් ධූරයකට පත්කිරීම**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, 1959 අප්‍රේල් මස 1 වැනි දින සිට, පහත සඳහන් කරන ලද මහතා රාජකීය ලංකා ගුවන් හමුදාවේ කොමිෂන් බලපත්‍ර ලත් ප්ලයිට් ලෙප්ටිනන්ට් කෙනෙකු වශයෙන් පත්කිරීම සහ ඔහු එම සේවයේ දන්ත කටයුතු පිළිබඳ ශාඛාවට ඇතුළත් කිරීම අනුමත කොට තිබේ :—

නම :

සිරියානන්ද ගුණසිංහ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. ද සොයිසා
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 13 වැනි දින,
කොළඹ 1.


1087—ජේ. ඇන්. බී 13135—3,666 (4/59)

1959 අංක 163

අංකය : ඩී. 3/රෙක් ච්/26.

## රාජකීය ලංකා ගුවන් හමුදාව—කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකට පත් කිරීම

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, 1959 අප්‍රේල් මස 1 වැනි දින සිට, පහත සඳහන් කරන ලද මහතා රාජකීය ලංකා ගුවන් හමුදාවේ කොමිෂන් බලපත්‍ර පත් නියමු නිලධාරියෙක් වශයෙන් පත් කිරීම සහ ඔහු එම සේවයේ ලේඛන ශාඛාවට ඇතුළත් කිරීම අනුමත කොට තිබේ :—

නම :

පටබැඳිගේ ෆ්‍රෙඩී සිරිපාල ජයසූරිය.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 13 වැනි දින,
කොළඹ 1.

---

1959 අංක 164

අංකය : ඩී. 3/රෙක් ච්/24.

## රාජකීය ලංකා ගුවන් හමුදාව—කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකට පත් කිරීම

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, 1959 මාර්තු මස 24 වැනි දින සිට, පහත සඳහන් කරන ලද මහතා රාජකීය ලංකා ගුවන් හමුදාවේ කොමිෂන් බලපත්‍ර ලත් නියමු නිලධාරියෙක් වශයෙන් පත් කිරීම සහ ඔහු එම සේවයේ පොලිස් කාර්‍ය පිළිබඳ ලේඛන ශාඛාවට ඇතුළත් කිරීම අනුමත කොට තිබේ :—

විමොති රත්නරාජ් නෙවින්ස් සෙල්වදුරේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 13 වැනි දින,
කොළඹ 1.

---

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1959 අංක 165

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියම කර ඇත්තේ ය :—

ඒ. 289/57.

1959 මාර්තු මස 19 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ඩබ්ලිව්. ජේ. ඒ. වැන්ලැන්ගන්බර්ග් මහතා (ඇම්.බී.ඊ.), සවකීය රාජකාරිවලට අතිරේකව, දේශීය වෛද්‍යක්‍රම සංවර්ධන කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 337/58.

1959 අප්‍රේල් මස 7 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු දොස්තර ඩබ්ලිව්. ඒ. කරුනාරත්න මහතා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 111/59.

1959 මාර්තු මස 30 වැනි දින සිට, ඊ. බී. තිසවීරසිංහ මහතා (සී.සී.ඇස්.) දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ, ආණ්ඩුවේ ඛනිජ විද්‍යාඥ ඇල්. ජේ. ඩී. ප්‍රනාන්දු මහතා සවකීය රාජකාරිවලට අතිරේකව, ලුණු කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 95/59.

1959 මාර්තු මස 25 වැනි දින සිට, ඒ. පී. කන්දසාමි මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ උප අධ්‍යක්ෂ ඩී. ජේ. ජයසිංහ මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව, අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීම.

ඒ. 50/59.

1959 පෙබරවාරි මස 16 වෙනි දින සිට 1959 මාර්තු මස 3 වෙනි දින දක්වා ජ්‍යෙෂ්ඨ සහකාර වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් ජේ. ඇෆ්. පොන්නම්බලම් මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව, වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 82/59.

1959 මාර්තු මස 7 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ප්‍රධාන සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් ඩී. ජේ. ද මැල්. මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව, ඉඩම් සහ විවාහ, උප්පැන්න සහ මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 132/52.

1956 ජනවාරි මස 10 වැනි දින සිට පී. සිවසම්බු මහතා උප පොලිස් සුපිරින්ටැන්ඩන්ට් කෙනෙකු වශයෙන්.

ඒ. 11/59.

එච්. ඒ. ජී. ද සිල්වා සහ ඇස්. පාසුපති යන මහතුන් පිළිවෙළින් 1959 මාර්තු මස 1 වෙනි දින සහ 1958 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට ආණ්ඩුවේ අධිනීතිඥයන් වශයෙන්.

ඒ. 120/59.

1959 අප්‍රේල් මස 26 වැනි දින සිට, ඇස්. ඩබ්ලිව්. ඕ. ද සිල්වා මහතා නිවාඩු පිට සිටින කාලය තුළදී, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වර ඇම්. ඩබ්ලිව්. ඇෆ්. අබේකෝන් මහතා පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්වරයා වශයෙන් ද්විතීයනය පිට වැඩ බැලීමට සහ 1959 ජූලි මස 26 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ද්විතීයනය පිට පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්වරයා වශයෙන්.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959 අප්‍රේල් මස 22 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලය,
තැ. පෙ. 500, කොළඹ 1.

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1959 අංක 166

අධිකරණ සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත්වීම් කර ඇත්තේ ය :—

අංකය. ජේඒ ඒ 21/48.

ඒ. ඊ. ආර්. කොරෙයා මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 මැයි මස 8 වැනි දින ගම්පල මහෙස්ත්‍රාත් උසාවියේ අංක 7,314 දරන නඩුව ඇසීමට, ගම්පල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය. ජේඒ ඒ 52/48.

ඩී. එච්. ද ඇස්. ගුණවර්ධන මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 අප්‍රේල් මස 25 වැනි දින, රත්නපුර දිස්ත්‍රික් උසාවියේ අංක 731 දරන නඩුව ඇසීමට, රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය. ජේඇල් 1/48.

ඩබ්ලිව්. ඊ. අබයකෝන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. ඇල්. කොරෙයා මහතා, 1959 අප්‍රේල් මස 10 වැනි සහ 12 වැනි දිනයන්හී හලාවත සහ පුත්තලම් අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් සහ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරවලට සහ පුත්තලම අතිරේක මහේස්ත්‍රාත් සහ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරවලට.

අංකය : ජේඒඒ 40/48.

බී. ආර්. ජී. විජේයකෝන් මහතා, 1959 අප්‍රේල් මස 25 වැනි දින මාතලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 4,273 දරණ නඩුව ඇසීමට මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර (මාතලේ උසාවියේ) ධුරයට.

අංකය : ජේඒ 8/48.

ජේ. ජේ. ඩේවිඩ් මහතා, 1959 අප්‍රේල් 18 වැනි දින, කල්මුනේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 7,219 දරණ නඩුවේ තීන්දුව දීමට මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරවලට.

අංකය : පීඇල් / ඇම්. 3/48.

එච්. මීදෙනිය මහතා නැති අතර, ඇෆ්. ජී. බී. පෙරේරා මහතා 1959 අප්‍රේල් මස 9 වැනි දින, කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල්, පරනකුරු, ගල්බොඩ සහ කිනිගොඩ කෝරළයන්හි ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඇල් / පී. 7/56.

ඇම්. ඇම්. පෙරේරා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඊ. ගුණසේකර මහතා, 1959 අප්‍රේල් මස 13 වැනි දින, 15 දින සිට 18 වැනි දින දක්වා, මහනුවර දිස්ත්‍රික්කයේ දකුණු සහ නැගෙනහිර මාතලේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට,

අංකය : පීඇල් / ඇෆ්. 1/56.

ඒ. ඇල්. ඇම්. ප්‍රනාන්දු මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරනතුරු, ඩී. සේරසිංහ මහතා, 1959 අප්‍රේල් මස 13 සහ 15 වැනි දිනයන්හි, හම්බන්තොට නොව තංගල්ල දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තු ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඇස්. ආර්. විජයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

තැ. පෙ. 573, කොළඹ,
17. 4. 59.

---

## වෙනත් පත් කිරීම්

**1959 අංක 167**

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගු වේ :—

අංකය : 74/48 (එම්.එෆ්).

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු මහතා 1959 මාර්තු මස 16 වෙනි දින පටන් මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට.

එෆ්. සී. පීටර්ස් මහතා 1959 මාර්තු මස 16 වෙනි දින පටන් මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට.

ආර්. ජී. ජී. ඕ. ගුණසේකර මහතා 1959 මාර්තු මස 16 වෙනි දින පටන් මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට.

ඒ. ආර්. එම්. ජයවර්ධන මහතා 1959 මාර්තු මස 16 වෙනි දින පටන් මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට.

එෆ්. සී. පීටර්ස් මහතා 1959 මාර්තු මස 16 වෙනි දින පටන් මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට.

වී. සී. බී. උනන්තැන්න මහතා 1959 මාර්තු මස 16 වෙනි දින පටන් මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට.

එස්. එෆ්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1959 අප්‍රේල් මස 20 වෙනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 1.

---

**1959 අංක 168**

අංකය : ඒ. ජේ. 34/2/58.

දිවිරුම් සම්බන්ධ ආඥාපනතේ 12 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1959 අප්‍රේල් මස 11 වෙනි දින සිට ටී. බී. කටුගහ මහතා බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිවුරුම් කොමසාරිස් වරයෙකු වශයෙන් ද,

1959 අප්‍රේල් මස 11 වෙනි දින සිට ඇම්. රත්නම් මහතා වවුනිකුලම් හි වාරිමාර්ග ඉංජිනේරු ධුරය දරණ කාලය තුළ මන්නාරම් අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිවිරුම් කොමසාරිස් වරයෙකු වශයෙන් ද,

1959 අප්‍රේල් මස 16 වෙනි දින සිට ඩබ්ලිව්. විජේතුංග මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් දිවිරුම් කොමසාරිස් වරයෙකු වශයෙන් ද,

පත් කර ඇත්තේ ය.

---

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1959 අප්‍රේල් මස 1 වෙනි දින සිට, එස්. එම්. තියෝෆිලස් මහතා නැවත වැඩභාරගන්නාතුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ උතුරු මන්මුනෙයි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩ බලන කාලය තුළ එම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට කේ. සොමසුන්දරම් මහතාද,

1959 අප්‍රේල් මස 1 වෙනි දින සිට, ජී. එම්. පොන්සේකා මහතා නැවත වැඩ භාරගන්නාතුරු, රත්නපුර දිස්ත්‍රික්කයේ පල්ලේ කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ජේ. බී. තිරිඇල්ල මහතාද,

1959 අප්‍රේල් මස 1 වෙනි දින සිට, ඊ. සී. ජේ. අතුකෝරාල මහතා නැවත වැඩභාරගන්නාතුරු, රත්නපුර දිස්ත්‍රික්කයේ උඩ පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට මහින්ද ජයවර්ධන මහතාද,

1959 අප්‍රේල් මස 3 වෙනි දින සිට, ඩී. එස්. මීගල්ල මහතා නැවත වැඩභාරගන්නාතුරු, කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරළේ උඩපත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩී. ඒ. ඇස්. අලගියවන්න මහතාද,

1959 අප්‍රේල් මස 3 වෙනි දින සිට, කේ. රාමනාදන් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඊයතවරායර් මහතාද,

1959 අප්‍රේල් මස 3 වෙනි දින සිට, පී. එල්. පැට්රික් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ අක්කරෙයි පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට බී. ඒ. ජේ. කාසිනාදර් මහතාද,

1959 අප්‍රේල් මස 5 වෙනි දින සිට, පී. ඒ. වනසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට කේ. පී. එස්. විජේතුංග මහතාද,

1959 අප්‍රේල් මස 9 වෙනි දින සිට, මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර මැදපළාත කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයට ජී. ඩබ්ලිව්. එම්. ඒ. බී. ගිරාගම මහතාද,

1959 අප්‍රේල් මස 10 වෙනි දින සිට, එස්. එම්. එස්. ගුණරත්න මහතා නැවත වැඩ භාරගන්නාතුරු, කොළඹ දිස්ත්‍රික්කයේ මස්කෙලිය කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. තිසේරා මහතාද,

1959 අප්‍රේල් මස 10 වෙනි දින සිට, එල්. පී. ඊ. කරුණාරත්න මහතා නැවත වැඩ භාරගන්නාතුරු, කොළඹ දිස්ත්‍රික්කයේ මීගමු නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. බී. පී. ද සිල්වා මහතාද,

1959 අප්‍රේල් මස 11 වෙනි දින සිට, සී. ඇලෙක්සැන්ඩර් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ කොදෙව් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ආර්. එස්. රාසරස් මහතාද,

1959 අප්‍රේල් මස 13 වෙනි දින සිට, එම්. කේ. ඩබ්ලිව්. පොන්සේකා මහතා නැවත වැඩ භාරගන්නාතුරු, කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එස්. දසනායක මහතාද,

1959 අප්‍රේල් මස 11 වෙනි දින සිට 15 වෙනි දින දක්වා මඩකලපු දිස්ත්‍රික්කයේ ඉරවූර් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලයතුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඒ. කන්දසියා මහතාද,

1959 අප්‍රේල් මස 16 වැනි දින සිට 26 වැනි දින දක්වා මඩකලපු දිස්ත්‍රික්කයේ ඉරවූර් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඒ. පෙරුමසිනාර් මහතාද,

පත් කර ඇත්තේ ය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන සථිර ලේකම්.

කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.
1959 අප්‍රේල් මස 21 වෙනි දින,

**1959 අංක 169**

සන්තානම් පතිරන්නැහෙලාගේ දොන් කුලසේන මහතා, බණ්ඩාරගම වාසස්ථානය සහ කාර්යාලය ඇතුව, පානදුර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදෙශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ
ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 8 වෙනි දින,
කොළඹදීය.

**1959 අංක 170**

ඩේවිඩ් රණවක මහතා, අවිස්සාවේල්ලේ වාසස්ථානය සහ කාර්යාලය ද දෙහිඕවිට අතුරු කාර්යාලයද ඇතුව, අවිස්සාවේල්ල අධිකරණ කොට්ඨශය ඇතුළත සිංහළ භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදෙශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ
ස්ථිර ලේකම්.

1959 මාර්තු මස 31 වෙනි දින,
කොළඹදීය.

**1959 අංක 171**

විජේපාල ලීලසේන අබේවික්‍රම මහතා මාතර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ
ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 8 වැනි දින,
කොළඹ දීය.

**1959 අංක 172**

සනත් සිරිසෝම මැන්දිස් ධීරරත්න මහතා මාතර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ
ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 8 වැනි දින,
කොළඹ දීය.

**1959 අංක 173**

ඉන්ද්‍රානි ජයතිලක මහත්මිය කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ
ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 8 වැනි දින,
කොළඹ දීය.

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ඕ. 103.

නුවර දේවස්ථාන ආඥාපනතේ 5 වෙනි වගන්තියේ (228 වෙනි පරිච්ඡේදය) යටතේ දොස්තර වී. එච්. ඇල්. ඇන්තනීස්, මුදලි ඒ. ඒ. ද අල්විස් සහ ගෝඩන් පයිපර් යන මහතුන් නුවර ශාන්ත පෝල් දේවස්ථානයේ භාරකරුවන් වශයෙන්ද, ඉහත සඳහන් ආඥාපනතේ 17 වෙනි වගන්තිය යටතේ ඇෆ්. බී. අයි (ලංඩන්) උපාධිධාරී සී. මුත්තයියා මහතා ඉහත කී දේවස්ථානයේ ගණන් පරීක්ෂක වශයෙන්ද, මෙම දේවස්ථානයේ ඊළඟ වාර්ෂික සභා රැස්වීම පවත්වනතුරු, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත් කරන්නට යෙදුණු බව මෙයින් දන්වනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 අප්‍රේල් 17 වෙනි දින,
අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය,
නුවරඑළිය.

**සමිති සමාගම් ආඥාපනත (105 වැනි පරිච්ඡේදය)**

වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් රිචඩ් ගෝඨාභය සේනානායක වන මම, අංක 9,773 හා 1947 සැප්තැම්බර් 24 වැනි දින දරණ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකර ඇති ප්‍රකාශයෙන් මදක් වෙනස්කර ඇති සමිති සමාගම් ආඥාපනතේ (105 වැනි පරිච්ඡේදය) 3 (බී) දරණ වගන්තියෙන් මට පවරා ඇති බලතල ප්‍රකාර, "සීමාසහිත ජාත්‍යන්තර අධ්‍යාපනික සමිතිය" නමින් පිහිටුවා ඇති සමිතිය පිහිටුවීමේ අභිප්‍රාව, අංක 10,703 හා 1954 අගෝස්තු 13 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයෙන්, සමිති සමාගම් ආඥාපනතේ (105 වැනි පරිච්ඡේදය) බලතල හා පහසුකම් හිමිකම් ඇති අභිප්‍රාවක් බව මෙම නිවේදනයෙන් අනුමත කරමි.

ආර්. ජී. සේනානායක,
වාණිජ හා වෙළඳ ඇමති.

1959 අප්‍රේල් මස 15 වැනි දින,
කොළඹදීය.

කළුතර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් අරුමදුර ෆ්‍රැන්සිස් අස්සිසි සිල්වා මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ
ස්ථිර ලේකම්.

1959 අප්‍රේල් මස 8 වැනි දින,
කොළඹ දීය.

# 4බී පෝර්මය

## 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචි කිරීමේ වැඩ බලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලේඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත අනුමත කිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත් නම් කුමන කාරණා නිසා එවැනි විරුද්ධතාවය මුල් කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධ කළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමත කරන බවයි.

විරුද්ධවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත් විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ
වැඩබලන කොමසාරිස් තැන.

1959 ක්වූ අප්‍රේල් මස 21 වෙනි දින,
කොළඹ.

## උප ලේඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| J 8569—1.7.51 | මරුදෙයි කම්මලන් නොහොත් කරුමාලෙයි, මවුන්ට් ජීන් වත්ත, වටවල | පලනියායි (භාර්යාව), මුත්තුසාමි (පුතා) |
| N 4589—15.3.51 | නාරායනන් සින්නයියා, අක්‍රමලෙයි කොටස, මැද කෝම්බ්‍රා වත්ත, වටගොඩ | සෙල්ලම්මා (භාර්යාව) |
| N 8357—26.7.51 | සෙලම්බරම් මාදසාමි, හුනුකොටුව වත්ත, කොත්මලේ | කාලිඅම්මාල් (භාර්යාව) |
| N 10305—4.8.51 | සත්ගරන් සන්දනම්රත්නම්, මැදකෝම්බ්‍රා වත්ත, වටගොඩ | සන්දනම් (භාර්යාව), රෝස්මේරි (දුව), අන්තෝනි (පුතා) |
| P 573—26.9.50 | රාමසාමි කරුප්පයියා, මවුන්ට්වර්නන් වත්ත, කොටගල | ඉලන්ජියම් (භාර්යාව), ජයන්ති (දුව), පෙරියනායිකි (දුව) |
| R-1224—26.11.50 | මුත්තුසාමි පෙරුමාල්, බඹරකැලේ වත්ත, නුවරඑළිය | මාරියායි (භාර්යාව) |
| R-1227—26.11.50 | වරදන් සින්නපායල්, බඹරකැලේ වත්ත, නුවරඑළිය | මේරි (භාර්යාව), සුබ්‍රමානියම් (පුතා), මහලිංගම් (පුතා), පුෂ්පවල්ලි (දුව), කුප්පු (දුව) |
| R-1575—18.3.51 | මුත්තුසාමි සින්නයියා, මහගස්තොටවත්ත, නුවරඑළිය | ලෙච්චුමී (භාර්යාව), ජෙගනාදන් (පුතා) |
| R-1742—14.4.51 | රායප්පන් රත්නම්ගේ වැන්දඹුව වූ පොන්නුසාමි මරිඅම්මාල්, කැල්සෝ වත්ත, නානුඔය | රායප්පන් නොහොත් තම්ගරාජ් (පුතා), අන්න සෙල්වම් (දුව), ඉරුදෙයසාමි (පුතා), මද්ලේ මාරී නොහොත් රන්ජිතමේරි (දුව), සේවියර් මයිකේ රාජ් (පුතා), ජෝශප් (පුතා) |
| R-1744—14.4.51 | කුප්පමුත්තු සිවසාමි, කැල්සෝ වත්ත, නානුඔය ... | මාරියායි (භාර්යාව), රාමසාමි (පුතා) |
| R-1755—14.4.51 | අන්තෝනිමුත්තු ආරෝකියම්, කැල්සෝ වත්ත, නානුඔය | සවරිඅම්මා (භාර්යාව), ජෙවමාලෙයි නොහොත් සෝමාලෙයි (පුතා), රීතම්මා (දුව), සවරිමුත්තු (පුතා), ජෝශප් (පුතා) |
| R-1815—14.4.51 | ජේයපෙරුමාල් පොන්නම්බලම්, කැල්සෝ වත්ත, නානුඔය | වීරමලේ නොහොත් පෙරුමාල් (පුතා), ගුන්බු නොහොත් මහමුනි (පුතා), පෙරිඅක්කා නොහොත් තන්ගාල් (දුව), කුනදියන් නොහොත් යේරුනාලම් (පුතා) |
| R-2339—22.4.51 | සින්නයියා සිලම්බරම්, පෙඩ්රෝ වතුයාය, නුවරඑළිය | පන්ජාලෙයි (භාර්යාව), කුප්පායි (දුව), අලගම්මාල් නොහොත් අයියම්මා (දුව), සින්නයියා (පුතා), පාර්වති (දුව), ජයරාජ් (පුතා), පාකියම් නොහොත් සිවපාකියම් (දුව), තනපාකියම් (දුව), රේවති (දුව) |
| R-2400—22.4.51 | කුප්පන් වීරයියා, ලවර්ස් ලීප් කොටස, පෙඩ්රෝ වතුයාය, නුවරඑළිය | කදිරායි (භාර්යාව), මරියාතා (දුව), සන්දසේකරම් (පුතා) |
| R-2961—27.5.51 | පරසුරාමන් සුබ්‍රායන්, ඉහළ කොටස, ඔලිෆන්ට් වත්ත, නුවරඑළිය | කාලි (භාර්යාව), පච්චමුත්තු (පුතා), අමරාවති (දුව) |
| R-3204—20.5.51 | සේවන් සාමිනාදන්, කෝච්ලොජ් වත්ත, කඳපොල. | කරුප්පායි (භාර්යාව), වල්ලිඅම්මා (දුව), වෙල්ලයියා (පුතා), කන්දයියා (පුතා), ආරායි (දුව), මාරියායි (දුව), ජේගනාදන් (පුතා), පාකියම් (දුව), මනිවේළු (පුතා) |
| R-3511—13.5.51 | පෙරමන් කදිර්වේළු, හැදර්සෙට් වත්ත, කඳපොල ... | මහමායි (භාර්යාව), ජය ලෙච්චුමි (දුව), වීරප්පන් (පුතා), මුරුගයියා (පුතා) |
| R-3632—22.4.51 | සන්නාසි සින්නයියා, නේස්බි වත්ත, නුවරඑළිය ... | රාසම්මාල් (දුව) |
| R-3633—22.4.51 | මුරුගන් ආබ්‍රහම් නොහොත් මුරුගන් කන්දයියා පිල්ලෙයි, නේස්බි වත්ත, නුවරඑළිය | රාසම්මා (භාර්යාව) |
| R-3634—22.4.51 | මයිකල් නොහොත් මුරුගන්ගේ වැන්දඹු වූ සන්දනම්, නේස්බි වත්ත, නුවරඑළිය | සින්නම්මා නොහොත් පාප්පම්මාල් (දුව) |
| R-4504—18.6.51 | කුප්පන් පෙරුමාල්, කැල්සෙ වත්ත, නානුඔය ... | පාප්පායි (භාර්යාව), සෙල්වරාජා (පුතා) |
| R-4506—18.6.51 | රාක්කන් සුන්දරම්, කැල්සෝ වත්ත, නානුඔය ... | රාක්කම්මා (භාර්යාව), සාමයන් නොහොත් සිච්චෙයි (පුතා) |

| ඉල්ලුම්පත්‍රයෙහි අංකය සහ දිනය | | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|---|
| R-5131—22.7.51 | .. | සෝලමුත්තු මුත්තුකරුප්පන්, උඩ රදැල්ල වත්ත, නානුඔය | කදිරායි (භාර්යාව), මුත්තු (පුතා), අන්ගම්මා (දුව), ලෙච්චිමන් (පුතා), කරුප්පායි (දුව), වේළු (පුතා), වල්ලිඅම්මා (දුව) |
| R-5653—22.7.51 | .. | ගෝපාල් සින්නයියා, උඩරදැල්ල වත්ත, නානුඔය ... | කරුප්පායි (භාර්යාව) |
| R-5790—18.6.51 | .. | පෙරියන්නන් සිවනු, කැල්සේ වත්ත, නානුඔය ... | පුච්චම්මා නොහොත් පූච්චි (භාර්යාව), මාරියායි (දුව), සරස්වති (දුව), ලෙච්චුමි (දුව), පද්මාවතී (දුව), රාජේස්වරී (දුව) |
| P 7478/Q/R—31.10.51 | | ආරුමුගම් මුරුගන්, උඩරදැල්ල වත්ත, නානුඔය ... | අත්තායි (භාර්යාව), මාරිමුත්තු (පුතා), සරස්වති (දුව), පලනිවේළු (පුතා) |
| V 4104—3.4.51 | .. | මාමුන් ඩිගේ දුව අන්නපූරනම්, පරන පැක්වේරිය කොටස, හොප්ටන් වතුයාය, හොප්ටන් | අදිමූලම් (පුතා) |
| W 1928/Y—27.4.51 | .. | මලයන් ඩි රාසයියා, මහතැන්න කොටස, සාර්නියා වතුයාය, බදුල්ල | පාර්වති (භාර්යාව), ගනේසන් (පුතා), නවමනි (පුතා), කනගු (දුව), මනෝහරන් (පුතා) |
| W 4415/Y—30.5.51 | .. | පෙරියතම්බි අදිමූලම්, නාරන්ගල්ල කොටස, ලෙජර් වත්ත වතුයාය, බදුල්ල | නාගමුත්තු (භාර්යාව), රාජේස්වරී (දුව), රාමනාදන් (පුතා), රාසලෙච්චුමි නොහොත් අන්නමුත්තු (දුව), වල්ලිනායගම් (දුව) |
| W 5379/Y—17.6.51 | | රාමසාමි කරුප්පන්, ඩොව්ලන්ඩ්ස් කොටස, සාර්නියා වතුයාය බදුල්ල | ලෙච්චුමි (භාර්යාව), තන්ගවේළු (පුතා), කමලම් (දුව), මීනාම්බාල් (දුව) |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## "කුර සහ මුව" රෝගය

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ කොටගල ගම්මුලාදැනි වසමේ ගම්වල ගවයන් අතර "කුර සහ මුව" රෝගය පැතිරී යන බැවි 1957තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) වැනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාතක් ලෙස මා විසින් වර්ෂ 1959 ක්වූ පෙබරවාරි මස 13 වැනි දින අංක 11,664 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ආයර්දස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1959 අප්‍රේල් මස 8 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිතැනගේ කාර්යාලයේ දීය.

---

## "කුර සහ මුව" රෝගය

මධ්‍යම පළාතේ නුවර එළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ මොරපේ ගමෙහි ගවයන් අතර "කුර සහ මුව" රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) වැනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාතක් ලෙස මා විසින් වර්ෂ 1959 ක්වූ මාර්තු මස 13 වැනි දින අංක 11,699 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ආයර්දස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1959 අප්‍රේල් මස 8 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිතැනගේ කාර්යාලයේ දීය.

## ප්‍රකාශනයයි

උතුරුමැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ආදායම් නිලධාරි කොට්ඨාශයේ එගොඩ පත්තුවේ ත්‍රිකොනමඩු, කටුවන්විල්ලු, වැලිකන්ද, කටුපොල, මනම්පිටිය ගම්මුලාදැනි වසම්වල ගම්වල ගවයන් අතර කුර සහ මුව රෝගය නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයර්දස අමරසිංහ වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව, පහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : මදුරුඔය.
දකුණට : මාවිල්ලු (තමන්කඩුව ආදායම් නිලධාරි කොට්ඨාශයේ සීමාව) ;
නැගෙනහිරට : 35 වැනි සැතපුම් කනුව (තමන්කඩුව ආදායම් නිලධාරි කොට්ඨාශයේ සීමාව) ;
බස්නාහිරට : මනම්පිටියේ මහවැලිගඟ හරහට ඇති පාලම.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙනයෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්බන්ධ කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යනුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර වැලිකන්ද පශු වෛද්‍ය තැනගෙන් හෝ තමන්කඩුව කරවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයර්දස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිතැන.

1959 අප්‍රේල් මස 10 වැනි දින,
පේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරිතැනගේ කාර්යාලයේ දීය.

## විශෙෂ නිවේදනයයි

1959 මැයි 1 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 අප්‍රේල් 30 වැනි බ්‍රහස්පතින්දා නිකුත් කරනු ලබන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම සහ නිවේදන, 1959 අප්‍රේල් 27 වැනි සඳුදා පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 අප්‍රේල් 9 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී